# දරුවන් උදෙසා බයිබලයක්



# දානියෙල් - සිංහ ගුහාවේ

ඉදිරිපත් කරන්නා: Edward Hughes

නිදර්ශනය කරන්නා: Jonathan Hay
Alastair Paterson

සකස්කරන්නා: Mary-Anne S.

පරිවර්ථනය කරන්නා

නිෂ්පාදනය කරන්නා: Bible for Children
www.M1914.org

©2023 Bible for Children, Inc.
අවසරය : මෙම කථාන්තරය උපුටා ගැනිමට හෝ මුද්‍රණය කිරීමට අවසර ඇතිමුත් එය විකිණීමට අවසර නැත.

දාරියුස් බබිලෝනියේ නව රජු ලෙස පත් වූයේය.
ඔහු දක්ෂ විය. ඔහුට පාලනය කිරීමට සහායකයින් ලෙස
තම රාජධානියේ හොඳම මිනිසුන් එකසිය විස්සක් තෝරා
ගත්තේය. ඉන්පසු ඔහු ඔවුන්ගෙන් තිදෙනෙකු තෝරාගෙන
ප්‍රධානීන් කළේය.
දානියෙල් ඒ
තුන්දෙනාගෙන්
කෙනෙකු
වූයේය.



දාරියුස් රජු දානියෙල්ට කොතරම් ගරු කළාද කිවහොත් ඔහු මුළු රාජධානියේම පාලකයා බවට පත් කිරීමට සිතුවේය.



අනෙක් නායකයෝ ඊර්ෂ්‍යයා කළෝය. ඔවුන් සැලසුම් කළේ දානියෙල්ගේ යම් වරදක් සොයා ඔහුව රජු සමග හේද කරවීමටය.



ඔවුන් කෙතරම් උත්සාහ කළත්, මෙම නායකයින්ට දානියෙල් ගැන නරක දෙයක් සොයා ගැනීමට නොහැකි විය. දානියෙල්, කළ සෑම දෙයකදීම ඔහු රජුට විශ්වාසවන්තව සිටියේය. එසේම, ඔහු කල්පනාකාරී හා දක්ෂ වූ අතර කරන සෑම දෙයක්ම ඔහුට හැකි උපරිමයෙන් කළේය.



ඊර්ෂ්‍යයා කළ නායකයන් තමුන්ට දානියෙල්ව කොටු කරගත හැකි එකම මාර්ගයක් පමණක් දැන සිටියේය. ඔහු ඊශ්‍රායෙල්වරුන්ගේ දෙවියන් වහන්සේට නමස්කාර කිරීමට මෙලොව කිසිම දෙයක් බාධාවක් කර නොගන්නා බව ඔවුහු දැන සිටියෝය.






දානියෙල්ගේ සතුරෝ සැලැස්මක් සිතුවෝය. ඔවුහු අලුත් නීතියක් සාදා රජු ලවා අත්සන් කර ගත්තෝය. සෑම කෙනෙකුම යාඥා කළ යුත්තේ දාරියුස් රජුට පමණක් බවත් අකීකරු වන ඕනෑම කෙනෙක් සිංහ ගුහාවකට දමනු ලබන බවත් නීතියේ සඳහන් විය.

දාරියුස් රජ අලුත් නීතියට අත්සන් තැබුවේය.



නව නීතිය නිසා දානියෙල්
වෙනස් නොවූයේය. ඔහු
නිතරම කරන දේ කළේය.
ඔහු දිනකට තුන් වරක් තම
විවෘත ජනේලය අසල දණින්
වැටී ස්වර්ගීය දෙවියන්
වහන්සේට යාච්ඤා කළේය.







ඊර්ෂයයා කළ
නායකයෝ
රජුට මේ ගැන
ඉක්මනින්ම ගොස්
කීවෝය. දානියෙල්ව
අත්අඩංගුවට
ගැනීම හැර වෙනත්
විකල්පයක් දාරියුස්
රජුට තිබුණේ නැත.
නීතියට අවනත විය
යුතුය. දානියෙල්ට
මැරෙන්නට සිද්ධ
වනු ඇත. රජු දැඩි
උත්සාහයක් ගත්
නමුත් නීතිය වෙනස්
කිරීමට ක්‍රමයක්
සොයාගත
නොහැකි විය.

දානියෙල්ට සිංහ ගුහාවකට දමා මැරීමට නියම විය. දානියෙල් කුසගින්නෙන් පෙළෙන සිංහයන් වෙතට හෙළනු ලැබීමට පෙර, දාරියුස් රජ ඔහුට කතා කොට, “ඔබ නොකඩවා සේවය කරන ඔබේ දෙවියන් වහන්සේ, ඔබ ගලවන සේක්වා”යි කීවේය.



රජතුමා එදා රෑ නිදා නොගත්තේය. පසුදා උදෙන්ම ඔහු නැවත සිංහ වළට දිව ගියේය.





දාරියුස් රජ, “ජීවමාන දෙවියන් වහන්සේගේ සේවක දානියෙල්, ඔබ නොකඩවා සේවය කරන ඔබේ දෙවියන් වහන්සේ ඔබව සිංහයන්ගෙන් ගලවා ගැනීමට සමත් වූවාද?” කියා කෑගැසුවේය. සමහර විට ඔහු පිළිතුරක් බලාපොරොත්තු නොවන්නට ඇත. නමුත් දානියෙල් පිළිතුරු දුන්නේය!

“රජතුමනි,
මාගේ දෙවියන්
වහන්සේ මට
හිංසාවක් නොකෙරෙන
පිණිස තමන්වහන්සේගේ
දූතයා එවා සිංහයන්ගේ
කටවල් වැසූ සේක! එසේම
රජතුමනි, මම ඔබ
ඉදිරියෙහි වරදක්
නොකළෙමි”යි
දානියෙල් හඬගා
කීවේය.



දාරියුස් රජු බෙහෙවින් සතුටු වූයේය. ඔහු දානියෙල්ව වළෙන් ගොඩ ගන්නා ලෙස අණ කළේය.



දෙවියන් වහන්සේ
දානියෙල් මුදාගත් බවත්
දානියෙල්ගේ සතුරන් දෙවියන්
වහන්සේගේත් සතුරන් බවත්
රජු දැන ගත්තේය. ඔහු අයහපත්
නීතියකට අත්සන්
කිරීමට තමුන්ව
රැවටූ සියල්ලන්ම
සිංහ ගුහාවට
හෙළන්නට
අණ කළේය.
සිංහයෝ
ඔවුන් කා
දැමුවෝය.



ස්වර්ගයේ දෙවියන් වහන්සේ තම විශ්වාසවන්ත සේවකයා වන දානියෙල්ව ආරක්ෂා කළ බව ලෝකය දැන ගැනීම, දාරියුස් රජුට අවශ්‍ය විය. ජීවමාන දෙවියන් වහන්සේට නමස්කාර කරන ලෙස සෑම කෙනෙකුටම අණ කරමින් රජු ලිපියක් ලිවීය. රජු නැවතත් දානියෙල්ව ගෞරවයට හා නායකත්වයට පත් කළේය.



දානියෙල් - සිංහ ගුහාවේ

**දේව වචනයෙන් එක් කථාවක්**

**බයිබලයේ**

දානියෙල් 6

**“ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ”**
**ගීතාවලිය 119:130**

# අවසානය

මෙම බයිබල් කථාන්තරය අපට පවසනුයේ, අප සෑදූ අපගේ මහෝත්තම දෙවියන් වහන්සේ පිළිබඳ දැනගෙන උන් වහන්සේ කව්දැ යි කියා හඳුනාගන්නා ලෙසයි.

දෙවියන් වහන්සේ විසින් පාපය යයි සලකන, අයහපත් දේ අප විසින් කර ඇති බව උන් වහන්සේ දන්නා සේක. පාපයට දඬුවම මරණයයි. එහෙත් දෙවියන් වහන්සේ අපට බොහො සේ ප්‍රේම කරන බැවින් උන් වහන්සේගේ එකම පුත්‍රයා අප වෙත එවූ සේක. ජේසුස් වහන්සේ කුරුසියේ වද වේදනා විඳිමින් ඔබේ පව් උදෙසා මරණයට පත් වූ සේක. ජේසුස් වහන්සේ මරණයෙන් නැගිට, තමාගේ නිවස වන ස්වර්ගයට ගිය සේක. ඔබ ජේසුස් වහන්සේ පිළිගෙන ඔබගේ පාපයට කමාව අයැදින විට උන් වහන්සේ ඔබට කමාව දෙන සේක. එවිට උන් වහන්සේ ඔබ සමඟ ජීවත් වනු ඇත. ඔබට ද සදාකල්හිම උන් වහන්සේ සමඟ ජීවත් විය හැක.

මෙම සත්‍යය ඔබ පිළිගන්නේ නම් ජේසුස් වහන්සේට මෙසේ පවසන්න.

ආදරණීය ජේසුස් වහන්ස, ඔබ වහන්සේ, දෙවියන් වහන්සේ බව මම විශ්වාස කරමි. ඔබ වහන්සේ මිනිස් බව ගෙන මාගේ පාපය වෙනුවෙන් දිවි පුදා දැන් නැවතත් ජීවමානව වැඩසිටින සේක. මගේ ජීවිතයට පැමිණ මාගේ පාප කමා කරන මෙන් ඉල්ලා සිටිමි. එවිට මට ඔබ වහන්සේ සමඟ අලුත් ජීවිතයක් ගතකිරීමට හැකි ය. ඔබ වහන්සේ සමඟ සදාකාල ජීවිතයට ද මට දිනක් උදා වනු ඇත. ආමෙන්.

දිනපතා බයිබලය කියවා දෙවියන් වහන්සේ සමඟ කතා කරන්න (ශු. ජොහන් 3:16)